# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1802/4 – 2013 මාර්තු 18 වැනි සඳුදා – 2013.03.18

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: පාදු/ප්‍රා.ලේ./පා/6/1/77.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ
යොමු අංකය: එල්ඩී/05/2008/ඩබ්එස්/310.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ, පිහිල්ලදෙනිය යන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2013 පෙබරවාරි මස 12 වැනි දිනැතිව මැන සකස් කරන ලද අංක මහ 6236 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන 'යහන්ගල වත්ත' නමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0066ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අංක 1**
ඉඩමේ නම: යහන්ගල වත්ත; හිමිකම් කියන අය: ඒ. එච්. ආයිසා රවුෆ්, අංක 136, කොස්වත්ත, මඩවල බසාර්; ප්‍රමාණය: හෙක්. 0.0066.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මැයි මස 15 වැනි දින පෙ.ව. 10.30 ට පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 මැයි මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

එල්. ඒ. සුජාතා විජේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
පාතදුම්බර.

2013 මාර්තු මස 13 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 – 35

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ඉප්‍රා/20/17/එල්එල්ඒ/28/2006.

බළන්ගොඩ - බණ්ඩාරවෙල මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩවත කෝරළේ සීලගම ග්‍රාම නිලධාරී වසමේ සීලගම ගමේ පිහිටි, අ.ග.පි. 560 අතිරේක 05හි කැබලි අංක 169 සහ 170 යන ප්‍රමාණයෙන් හෙක්. 0.0434ක් වන ඉඩම් කැබලි දෙක (02):

01. **කැබලි අංක 169**
ඉඩමේ නම: අඹගහමුල වත්ත හේන; මුල් හිමිකම් කියන අය: ඩබ්. එම්. අසංක බණ්ඩාර; ප්‍රමාණය: හෙක්. 0.0269.

02. **කැබලි අංක 170**
ඉඩමේ නම: අඹගහමුල වත්ත හා දූසින් ගෙදර වත්ත; මුල් හිමිකම් කියන අය: ඩබ්. එම්. අසංක බණ්ඩාර; ප්‍රමාණය: හෙක්. 0.0165.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 අප්‍රේල් මස 29 වැනි දින පෙ.ව. 9.30 ට ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 අප්‍රේල් මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජේ. එල්. සී. කේ. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පේ.

2013 මාර්තු මස 13 වැනි දින,
ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 – 37

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.